VIDUS 3-2-5

# කඩිනම් මහවැලි සංවර්ධන වැඩ සටහන

## ඩී. ඩී. ජී. පී. ලද්දුවහෙට්ටි

සභාපති, මහවැලි සංවර්ධන මණ්ඩලය

මහියංගනයට පහළින් පිහිටි මහවැලි ද්‍රෝණියේ හා මදුරු ඔය ද්‍රෝණියේ අක්කර 340,000 ක ප්‍රදේශයක් සංවර්ධනය කිරීම කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහනෙන් අපේක්ෂා කරනු ලැබේ.

මීට අමතරව, මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ 1978 හා 1979 යන වසරවලදී කලාවැව ද්‍රෝණියෙහි අක්කර 56,000 ක බිම් ප්‍රමාණයක්ද සංවර්ධනය කරනු ලැබේ. මෙම සංවර්ධනය සඳහා ප්‍රධාන ඇල මාර්ග සැතපුම් 225 ක්ද අවශ්‍ය වනු ඇත. සංවර්ධන කාර්යාවලියෙහිදී අධෝව්‍යුහමය පහසුකම් සඳහා නාගරික 350 ක් ග්‍රාමීය මධ්‍යස්ථාන 1600 ක් හා කුඩාගම් 8000 ක් පමණ පිහිටුවිය යුතු බව මෙයින් අදහස් වේ. ජල සම්පාදිත වගාකිරීම් සඳහා පාලිත ජලය සපයනු වස් ප්‍රධාන ජලාශ පහක් ඉදිකරනු ලැබේ. මේවා නම්, කොත්මලේ අසල කොත්මලේ ජලාශය, තෙල්දෙණියෙහි වික්ටෝරියා ජලාශය, රන්ටැඹේ අසල රන්දෙනිගල ජලාශය, උල්හිටියෙහි උල්හිටිය–රත්කිඳ ජලාශය හා පිඹුරත්තෑව අසල මදුරු ඔය ජලාශයද වේ.

ලෝක බැංකුවේ අනුමැතිය හා ආශීර්වාදයද සහිතව ද්විපාර්ශ්වික ආධාර මත මිතුරු රටවල් මගින් දෙනු ලබන ආධාර යෝජනා ක්‍රම යටතේ මෙම ජලාශ ඉදිකරනු ලැබේ.

වැඩසටහන සම්පූර්ණ කිරීමේ ඉලක්ක මුදුන්පත් කරගැනීමේ අභිප්‍රායෙන් විදේශීය ඒජන්සි මගින් බෙහෙවින් යන්ත්‍රසූත්‍ර යොදගැනීමේ ක්‍රම උපයෝගී කරගනිමින් මෙම ජලාශ ඉදිකරනු ලැබේ. එසේ වුවත්, යෝග්‍ය නිපුණතා ඇති අයට වැඩියෙන් රැකියා සැලසීමට හා මෙම දැවැන්ත යෝජනා ක්‍රමය සංවර්ධන කිරීමෙහිලා සමාජයේ සෑම ස්ථරයකටම සහභාගි විය හැකිවන අන්දමට නිර්මාණය කළ ශ්‍රම ප්‍රකර්ෂ ක්‍රම උපයෝගි කරගනිමින් යටිගං ප්‍රදේශයේ මාර්ග, ඇළමාර්ග හා ගොඩනැගිලි බඳු වාරිමාර්ග හා අවර ව්‍යුහමය පහසුකම් සලසන වැඩ දේශීය කණ්ඩායම් විසින් ඉටුකළ යුතුවේ.

ඉදිරි සය වසර ඇතුලත ඉටුකළ යුතුවන වැඩ රාශිය බොහෝ දෙනෙකුගේ පරිකල්පනා විස්මිත කරවීමට ඉඩ ඇත. මෙම කාර්යය විධිමත්ව විශ්ලේෂණය කළහොත්, පළමුවෙන්ම දැනට සංවර්ධනය වී නොමැති ප්‍රදේශ කරා ළඟාවිය හැකිවන පරිදි පාරවල් හා ප්‍රධාන ඇළමාර්ග ඉදිකළ යුතුය. ප්‍රධාන ඇළමාර්ග සැතපුම් 225 ක් ඉදිකිරීමට හාරා ඉවත් කළ පස් හා පාෂාණ ප්‍රමාණයේ සාමාන්‍යය ඝන 40,000 කි. අවුරුද්දකට දින 250 ක් අඩංගු අවුරුදු 4 ක කාලසීමාවක් ඇතුලතදී දිනකට ඝන 10,000 ක් හැරිය යුතුය.

නදබව විෂමාකාරි වූ පස 'රිපර්' බඳු වූ යන්ත්‍ර මගින් බුරුල් කළහොත් (පාෂාණ කැනීමේදී හැර) ඉටුකළ හැකි වැඩ ප්‍රමාණය මිනිස් දිනකට එක් ඝනයකට වැඩිවන බව සොයාගෙන ඇත. මෙම කර්තව්‍යය සඳහා පුද්ගලයන් 10,000 දෙනෙකුට ඍජු වශයෙන් රැකියා සැපයිය හැකි බවද පෙනේ.

මීට අමතරව, ද්‍රාව ව්‍යූහ ඉදිකිරීම, ඇල මාර්ගවල පාෂාණ පිපිරවීම, ද්‍රව්‍ය ප්‍රවාහණය ආදී කටයුතු සඳහාද පුහුණු සේවකයන් ප්‍රමානානුකූල සංඛ්‍යාවක් අවශ්‍ය වනු ඇත. මෙම සංඛ්‍යාව පස් කැනීමේ වැඩවල නියුතු සංඛ්‍යාවෙන් සියයට තිහකට වඩා වැඩි නොවන බව සොයාගෙන ඇත.

තවත් මෙහෙයුම් ක්ෂේත්‍රයක්, එනම්: ගොඩනැගිලි සම්බන්ධයෙන් අධිර ව්‍යූහ පහසුකම් සැලසීම උදෙසා ග්‍රාමීය මධ්‍යස්ථානයක් පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත විය යුතුයයි සලකනු ලැබේ.

සමූපකාර ගබඩාව හා ග්‍රාමීය බැංකුව
ගොවි අභ්‍යාස මධ්‍යස්ථානය
විශාල ගබඩා 7 ක්
ප්‍රාථමික පාඨශාලාව
උප තැපැල් කාර්යාලය
නේවාසික නිල නිවාස 8 ක්

මේවා මධ්‍යම ප්‍රමාණයේ කොන්ත්‍රාත්කරුවන්ට වෙන් වෙන්වූ කොන්ත්‍රාත් වශයෙන් ප්‍රදානය කර, එක් එක් ග්‍රාමීය මධ්‍යස්ථානයක් සඳහා මිනිසුන් 100 දෙනෙකුට නොවැඩි ගණනක් ඒ සඳහා යෙදවුවහොත් අවුරුදු දෙකකට වැඩි කාලයක් ඒ සඳහා ගත නොවනු ඇත.

එනිසා, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කොන්ත්‍රාත්කරුවන්ට කටයුතු කළහැකිවන අන්දමේ අවශ්‍ය පහසුකම් හා සුදුසු වාතාවරණයක් සැලසීමෙන් මෙම මෙහෙයුම් කරා ශ්‍රමය යොමුකළ හැකි වේ නම් ඉලක්ක මුදුන්පත් කරගත හැකිය. එසේවුවද, මෙම කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රවාහණ, උපකරණ, ණය හා බැංකු පහසුකම්ද ගොඩනැගිලි ද්‍රව්‍ය ආදී පහසුකම් හා පහසුවෙන් කම්කරුවන් ලබාගැනීමට ඉඩකඩ ද සලසා තිබිය යුතුය.

මධ්‍යම ප්‍රමාණයේ කොන්ත්‍රාත්කරුවන් වැඩි දෙනෙකු තමන්ම කම්කරුවන් සපයා ගනී. එසේවුවද, රජයේ අභිමතාර්ථය වනුයේ පුද්ගලික කොන්ත්‍රාත්කරුට දියුණුවීමට යෝග්‍ය වාතාවරණයක් ඇතිකරනු පමණක් නොව, මෙම ජාතික සංවර්ධන වැඩ සටහනෙහි එබඳු සංවිධානයන්ද සහභාගි කරවා ගැනිම සඳහා ඔවුන් පෙළඹවීමද වේ.

මහියංගනයෙහි සිට ත්‍රිකුණාමලය දක්වා සහ පොළොන්නරුවේ සිට වාලච්චේනෙයි දක්වා ව්‍යාප්ති වන මෙම ප්‍රදේශය ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අතින් සංවර්ධනය කිරීමට අදහස් කර ඇත. මෙම ප්‍රදේශයේ පස විශ්ලේෂණය කර ඇති අතර ආර්ථිකයට අවශ්‍යව ඇති බෝග වර්ග කිහිපයක්ද තෝරාගෙන ඇත. බැර පස සඳහා වී වර්ග නියම කර ඇති අතර, මනාව දිය සිඳි ප්‍රදේශ සඳහා වෙනත් බෝග හා කාර්මික බෝගද නියම කර ඇත.

මූලික නිෂ්පාදිත ද්‍රව්‍යවලට අමතරව, ඇතැම් කෘෂිපාදක කර්මාන්ත කිහිපයක්ද තෝරාගෙන ඇති අතර මෙමගින් උචිත අභියෝගයතා සහිත අයට රැකියා සැලසෙනු ඇත. එමනිසා ඉඩම් පවරාදීමේ ක්‍රම ඒ ඒ බෝගය සඳහා පිළියෙල කල ආර්ථික සාධ්‍යතාවය සහිත ඒකකය මත රඳා පවතිනු ඇත. ඇතැම් බෝග වැවිලි වශයෙන් වගාකළ යුතුවේ. මූලික නිෂ්පාදිත ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නෙකුට සේවය සැලසීම සඳහා අවශ්‍ය කම්කරුවන්ගේ ප්‍රමාණය සියයට විස්සක් ලෙස තක්සේරු කර ඇත.

ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරයේ ඉතිහාසය 19 වන සියවසේ අවසාන දශකය දක්වා දිවේ. එවක් පටන් ප්‍රතිපත්ති, පවරාදීමේ ඒකක හා පරමාදර්ශී ගොවියා පිළිබඳ සංකල්ප ආදිය සම්බන්ධයෙන් ජනපද ව්‍යාපාර විවිධ ස්වරූප ගෙන ඇත. වියළි කලාපය නිරාවරණය කිරීම, තෙත් කලාපයේ ජනගහනය සංකේන්ද්‍රණය වී තිබීම ලිහිල් කිරීම, ඉඩම් නැතිකම අඩුකිරීම හා ස්වෝත්සාහී හා ස්වාධීන ගොවි සමාජයක් පිහිටුවීම වැනි මූල් ප්‍රතිපත්ති කේන්ද්‍රණය වී තිබීණ. වියළි කලාපය අප ජාතික හා ආගමික උරුමයෙහි නිජබිම වීමේ කරුණෙන් ජනාවාස පිහිටවූ මුල් වකවානුවේදී ප්‍රතිපත්ති නිර්මාපකයන් උදෙයාගිමත් කිරීමෙහිලා ඉන් ඇතිවූ බලපෑම සුළුපටු නොවේ.

මහවැලි සංවර්ධන ප්‍රදේශය සඳහා යොදගනු ලැබූ ජනාවාස ප්‍රතිපත්තිය සකස් කරගන්නා ලද්දේ සවිස්තරාත්මක අධ්‍යයනයකින් පසුවය. ජනාවාස පිළිබඳ අතීත අත්දැකීම්වලින් එය සරුවී ඇති අතරම අතීතයේ වැරදි යළි සිදු නොවීමට සැලකිලිමත් වී ඇත. ජනාවාසවල මුල් අවස්ථාවලදී කුඹුරු අක්කර 5 ක් හා ඉඩම් අක්කර 3 ක් ලෙස පැවති පවරාදීමේ ඒකකය, ක්‍රමක්‍රමයෙන් ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් කුඹුරු අක්කර 2 ක් හා ඉඩම් අක්කර 1 ක් දක්වා අඩුකරන ලදි. මහවැලි සංවර්ධන ප්‍රදේශය සඳහා යොදගනු ලබන ඒකකය ගොවි ඉඩම් අක්කර $2\frac{1}{2}$ ක් හා ගේදොර සඳහා අක්කර 1/2 කින්ද සමන්විත වේ. කුලියට ලබාගත් කම්කරුවන් කෙරෙහි වැඩි බලාපොරොත්තුවක් නොමැතිව පවුලේ අය විසින් වගාකළ හැකි බිම ප්‍රමාණය, සුදු කරපටි හැඳි සේවකයකු හා තුලනාත්මකව බැලීමේදී පවුලට උපයාගත හැකි ආදායමේ සාමාන්‍යයනාදී කරුණු සලකා බැලීමෙන් මෙම නව පැවරුම් ඒකකය යොදගන්නා ලදි.

**ජනාවාස සැලසුම්කිරීම :** දනට පවත්නා පුරාණ ගම්, ජනාවාස හා ගම් පුළුල්කිරීමේ ව්‍යාපාර, අලුතෙන් පිහිටවූ ගම් හා තරුණයින් පදිංචි කරවීමේ ව්‍යාපාර ආදිය පිළිබඳව අධ්‍යයනය කරන ලදි. මහවැලි ප්‍රදේශයේ කුඩා ගම් වර්ගයේ ජනාවාස ඇතිකිරීමට ආභාසය වී ඇත්තේ පුරාණ ගම පිළිබඳ සංකල්පයයි. එක් කුඩා ගමක් පවුල් 100 සිට 125 දක්වා පමණ සංඛ්‍යාවකින් සමන්විත වන අතර, ඒක වර්ගික කණ්ඩායම් එක්කිරීමෙන් සමාජීය සංසක්තිය සඳහා ඉඩ සැලසේ. මෙම ගම්වලට පාඨශාලා, වෛද්‍ය හා තැපැල් පහසුකම්, සමූපකාර, ප්‍රජා මධ්‍යස්ථාන, ආගමික වන්දනා ස්ථාන, සුසාන භූමි, කමත් හා වෙන්කළ කැලෑ ප්‍රදේශ බඳුවූ මූලික ප්‍රජා සේවා අවශ්‍යතා සපයාදීමට සාධ්‍යතාවයක් ඇති බැවින් ඒවා පුරාණ ගම්වලට වඩා දියුණු තත්ත්වයක ඒවා වේ. මෙබඳු කුඩාගම් 4 කින් හෝ 5 කින් සමන්විත කණ්ඩායමක ග්‍රාමීය මධ්‍යස්ථානයක් ඇත. මෙයාකාරයෙන් කුඩාගම් සමූහගත කිරීමෙන්, කුඩාගම් මට්ටමෙහිදීට වඩා උසස් මට්ටමකදී සාමාජික, ආර්ථික හා ආගමික පහසුකම් සැලසිය හැකිවේ. ගොවි පවුල් 500 සිට 600 දක්වා පහසුකම් සැලසිය හැකිවන පරිදි මෙම ග්‍රාමීය මධ්‍යස්ථාන නිර්මාණය කර ඇත. ගොවි පවුල් 2500 සිට 3000 කින් යුතු සමූහ 5 ක් හෝ 6 කට සේවා සැලසීම සඳහා උප-ප්‍රාදේශීය මට්ටමේ නාගරිකයක් පිහිටවනු ලැබේ. පදිංචිකරුවන්ට වඩා උසස් මට්ටමේ පහසුකම් සැලසිය හැකිවන අයුරු නාගරිකය නිර්මාණය කරනු ලැබේ.

පදිංචිකරුවන් තෝරාගැනීමේදී අදාළ උපමානයන් පවා වෙනසියාවට භාජනය වී ඇත. මීට පෙර අදාලවූ උපමානයන් පවුල් බර හා ඉඩම් අභිමිභාවය මත බෙහෙවින් රඳා පැවතුන අතර, ඒවා එවකට වලංගුවූවද වර්තමාන තත්ත්වය අනුව එතරම් අදල නොවන බැවින්, පවුලක සාමාජිකයන්ගේ අත්දැකීම්, අධ්‍යාපන මට්ටම, පෞරුෂත්වය හා නායකත්වය, වයස හා වැඩ කිරීමට ඇති හැකියාව බඳුවූ සාධකවලට වැඩි වැදගත්කමක් ලබාදී ඇත.

ජනගහනය විහිත වූ මෙම ප්‍රදේශවල රැකියා නියුක්තිය පිණිස පුද්ගලයන් පොළඹවා ගැනීම සඳහා මෙබඳු සංවර්ධනය නොවූ ප්‍රදේශවල පුරෝගාමීන්ට පාරිතෝෂික ප්‍රදනය කිරීම අවශ්‍ය වනු ඇත. මේ දක්වා විධිමත් ක්‍රම සකස් කර නැතත්, ඉඩම් කච්චේරි හෝ වෙනත් ක්‍රම මගින් තෝරා ගන්නා අයට වඩා, සංවර්ධනය උදෙසා වැඩි සේවාවක් ඉටුකළ පුද්ගලයකුට (ඔහු අනෙ සුදුසුකම් සහිත අයෙක්ද වේ නම්) සංවර්ධන ප්‍රදේශයේ ඉඩම් හෝ වෙනත් සමාන ප්‍රතිලාභ සඳහා වැඩි අයිතිවාසිකමක් තිබිය යුතු ලෙස සැලකිය හැක.

මෙම ප්‍රදේශයේ සංවර්ධනය සැලසුම්කිරීමේදී මෙම ඒකාබද්ධ ප්‍රජාවට අවශ්‍ය නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා මූලික වශයෙන් සංවර්ධන වැඩසටහනට සහභාගිවූ අය අතුරෙන් පුද්ගලයන් තෝරාගනු ලැබේ.

මෙම වැඩසටහන, ඇද වැටුණ ආර්ථිකය ප්‍රබෝධමත් කිරීමේ එකම මාර්ගය ලෙස සලකා සෑම රටවැසියෙකුම අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව මෙහිලා සහභාගි වුවහොත්, නිසැකයෙන්ම ඉතාමත් කෙටි කාලසීමාවක් තුලදී අප රට සංවර්ධනය කරා ගමන් කරනු ඇත.